වස්ත්‍රය, අපට සැප පහසුව, උණුසුම, ආරක්ෂාව සහ පෙනුමද ලබා දෙන්නේය. එය නිසැකයෙන්ම බිරිඳ සහ සැමියා අතර පවතින සම්බන්ධතාවය බඳුය.

## විවාහ ජීවිතය තුළ ඇති ආදරය සහ කරුණාව

"ඔබ අතුරින් උතුම් අය වන්නේ, ඔබගේ බිරින්දෑවරුන්ට උසස් ලෙස සලකන්නන්ය"යැයි නබිතුමාණන් පැවසු වේ, ස්වාමියා විසින් තම බිරිඳට හොඳින් සැලකිය යුතුබව දිරිගැන්වීම සඳහාය.

> ඔබගේ බිරිඳන් ඔබට සිත සුව ලැබීම පිණිස ඔබගෙන්ම නිර්මාණය කර, ඔබ අතර ආදරය හා සෙනෙහස ඇති කර ඇත. නියත වශයෙන්ම මෙය මෙනෙහි කරන අයට මෙය හොඳ සළකුණකි.
> අල්-කුර් ආනය 30-21

දිනක් කෙනෙකු, නබිතුමාගේ බිරිඳක්වන අයිෂා තුමියගෙන් එතුමා නිවසේදී කෙසේ ක්‍රියාකරන්නේ දැයි විමසීය. එවිට "එතුමාණන්ද නිවසේදී ඔබලා වැනිය. බෙහෙවින් මෘදු, නිර්ලෝභී, ත්‍යාගශීලී පුද්ගලයෙකි,

නිවසේ එදිනෙදා සාමාන්‍ය වැඩ කටයුතු වලදී භාර්යාවන්ට නිතරම උදව් උපකාර කරමින් වස්ත්‍ර තමන්ම මසා ගත් අතර සපත්තු තමන් විසින්ම පිළිසකර කර ගන්නා ලදී යැයි ඇය පැවසුවාය. මෙයින් පැහැදිලි වන්නේ එතුමාණන් පොදුවේ නිවසේ සියළු කටයුතුවලදී සහාය ලබා දී ඇති බවයි.

## මවට සහ දියණියට ඇති උතුම් ස්ථානය.

මවට, තම දරුවා කෙරෙහි, විශේෂයෙන් කුඩා කළ ඇය ලබාදුන් අසීමිත ආදරය, කරුණාව, දයාව මගින් ඉතා විශාල බලපැවැත්මක් ඇත. නිසැකයෙන්ම සමාජයක සාර්ථකත්වය රඳා පවතින්නේ මව මතය. එබැවින් මවට ඉතා ගෞරවයෙන් යුතුව සහ උසස් කොට සැලකීම ඉස්ලාමය අවධාරණය කරයි.

දෙවියන්වහන්සේ මෙසේ පවසයි.

> අප මිනිසාට තම මවට යුතුකම් ඉටු කර කරුණාවන්ත වන ලෙස අණ කර ඇත. ඇය ඉතා අපහසුවෙන් ඔහුව උසුලා, ඉතාමත් අමාරු-වෙන් ප්‍රසුත කරන්නීය.
> අල්-කුර්ආනය 46 -15

දිනක් නබිතුමාණන් වෙත පැමිණි කෙනෙකු මෙසේ විමසීය. "දෙවියන්වහන්සේගේ දූතයාණෙනි මිනිසුන් අතුරින් මාගේ සැලකිල්ලට බඳුන් කළ යුත්තේ කාවද? " එවිට එතුමාණන්, "ඔබගේ මව" යැයි පිළිතුරු දුන්හ. මෙසේ දෙවරක්ම ඇසූ විට එකම පිළිතුර දුන්හ. ඉන්පසු කාවදැයි සිව්වන වරට ඇසූ කළ "ඔබගේ පියා" යැයි එතුමාණන් පිළිතුරු දුන්හ.

v1.01

ඉස්ලාමය යහපත් ප්‍රතිඵල ලබා දෙන බවට පොරොන්දුවී ඇත්තේ තමන්ගේ මවට ගරු බුහුමන් දැක්වූ අයට පමණක් නොවේ එම ආනිසංශය ගැහැණු දරුවන් හොඳින් හදා වඩා ගත් දෙමාපියන්ටත් හිමිවේ.

මුහම්මද් නබිතුමාණන් මෙසේ පැවසූහ. "කවුරුන් හෝ තමා හට දෙවියන්වහන්සේ ලබා දුන් ගැහැණු දරුවන් දෙදෙනාට කරුණාවෙන් සලකන්නේද, ඔහුට ස්වර්ගයට ඇතුල්වීමට එම දියණියන් දෙදෙනා හේතුවක් වනු ඇත"

## නිගමනය

ඉස්ලාමයට පෙර කාන්තාවන් සමාජයේ නින්දාවට බඳුන් වී තිබුණි.  කුඩා ගැහැණු දරුවන් පණ පිටින් වළලනු ලැබූහ. ගණිකා වෘත්තිය බහුලව පැවතුණි. දික්කසාද බලය හිමි වී තිබුනේ පිරිමින්ට පමණි. දේපොළ උරුමය බලවතුන්ට පමණි. .කාන්තාවන්ට කරනු ලබන වද හිංසන අධික වශයෙන් පැතරී තිබුණි. ඉස්ලාමය පැමිණීමත් සමඟ මෙවැනි ක්‍රියාවන් සම්පූර්ණයෙන්ම තුරන් විය. නමුත් සමහර දියුණු රටවල්වල දැනුදු කාන්තාවන්ට හිමිවිය යුතු ගෞරවය ලබා දී නැත. කෙසේ වෙතත් කාන්තාව යනු මාහැඟි වටිනා එමෙන්ම නින්දාවට බඳුන් නොවී ගෞරවයට පාත්‍ර විය යුතු කෙනෙකු බව ඉස්ලාමය සලකයි. ඇතැම් රටවල්වල හා මුස්ලිම් පවුල්වල සිදුවන කාන්තා අසාධාරණ කම්වලට ඉස්ලාමය සාදක නොවන අතර එය ඔවුන් පිළිපදින වැරදි සංස්කෘතිකයන් නිසා සිදුවන්නෙකි. ඉස්ලාමය කාන්තාවන්හට පීඩාවක් ගෙනදෙන ආගමක් නම් ලොවේ බොහෝ කාන්තාවන් ඉස්ලාමය වැළඳ ගැනීමට කැමැත්තක් දක්වන්නේ මන්දැයි ප්‍රශ්නාර්ථයකි.

සියළු ජීවීන්ගේ අධිපතියාවූද, නිර්මාතෘවූද, ආරක්ෂකයාවූද, දෙවියන්වහන්සේ මෙසේ පවසයි.

> "ඇත්තෙන්ම, ධර්මයට කැප වූ පිරිමින්ටද ගැහැණුන්ටද, දේවවිශ්වාසය තැබූ පිරිමින්ටද ගැහැණුන්ටද, තම දෙවියන්ට අවනතවූ පිරිමින්ටද ගැහැණුන්ටද, ඉවසිලිවන්ත පිරිමින්ද ගැහැණුන්ටද, සත්‍යවන්ත වූ පිරිමින්ටද ගැහැණුන්ටද, දෙවියන්ට බිය බැතිවූ පිරිමින්ටද ගැහැණුන්ටද...... යනාදී පිරිසට දෙවියන්වහන්සේ සමාවද උතුම්වූ ප්‍රතිඵලයන් පිළියෙළ කර ඇත.
> අල්-කුර්ආනය 33-35.

More Information

p (+61) 3 9354-7500 w iisna.com/pamphlets e shareislam@gmail.com

Donation Details (Every $1 AUD donated produces 15 pamphlets)

Bank Name Commonwealth Bank Account Pamphlet Project Australia
BSB 063620 Account 10532332 Swift (international) CTBAAU2S

# ඉස්ලාමය තුළ කාන්තා අයිතිවාසිකම්




learn the basics

www.iisna.com/pamphlets